**ශීර්ෂය 175 - රාජ්‍ය සම්පත් සහ ව්‍යාවසාය සංවර්ධන අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ හා 2 ඡේදයෙහි අමාත්‍යාංශයේ ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ ශිර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

## 1.1 විගණන විෂය පථය

රාජ්‍ය සම්පත් සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 ජූලි 30 දින අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**2.2 මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශයට සළසා තිබුණු රු.මිලියන 1,419.21 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.මිලියන 1,394.20 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 25.01 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 1.76 ක ප්‍රමාණයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 93.18 | 81.41 | 11.77 | 12.63 |
| මූලධන | 1,326.03 | 1,312.79 | 13.24 | 1.00 |
| **එකතුව** | **1,419.21** | **1,394.20** | **25.01** | **1.76** |

**2.3 අත්තිකාරම් ගිණුම**

**2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 17501 | 4.50 | 2.86 | 1.50 | 2.59 | 20.00 | 9.78 |

**2.3 පොදු තැන්පත් ගිණුම**

**------------------------------**

අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුමේ ශේෂය රු.මිලියන 2.06 ක් විය.

**2.4 විගණන නිරීක්ෂණය**

**----------------------**

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ දක්වා ඇත.

**3. ශීර්ෂය 175 - රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය**

**----------------------------------------------------------------**

**3.1 විසර්ජන ගිණුම**

**------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 02 කට සළසා තිබුණු රු 900,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි.

(ආ) වැය විෂයයන් 03 කට රු.4,436,858 ක අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 77 ක සිට සියයට 87 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.2 පොදු තැන්පත් ගිණුම**

**----------------------**

වර්ෂ 2 ක් ඉක්මවූ (ඉඩම් තැන්පතු හැර) එකතුව රු.139,924 ක තැන්පතු දෙකක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

---------------------------------------------------------------------

විෂය අංක 17501 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට ස්ථාන මාරුවීම් ලබා ගිය හා සේවය හැර ගිය නිලධාරීන්ගෙන් අයවීම් හිඟහිට තිබුණු රු.739,594 ක ණයශේෂ මාස 6

ක සිට වර්ෂ 03 ක් දක්වා  කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දූර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) අමාත්‍යාංශය විසින් ණය ගෙවීමේදී පිළිපැදිය යුතු විධිවිධාන අනුගමනය නොකර රු.483,145 ක ආපදා ණය ගෙවා තිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

**--------------------------**

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරික්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

**(ඇ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

**-----------------------------------------------------------**

ජනතා වතු සංවර්ධන මණ්ඩලය සතු  වාහනයක් විධිමත් අනුමැතියකින් තොරව ජනතා වතු කළමනාකරණ සංවර්ධන අමාත්‍යාංශය හා රාජ්‍ය සම්පත් සහ ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය විසින් 2009 අප්‍රේල්  08 දින සිට භාවිතයට ගෙන තිබුණි.

**(ඊ) බේරුම් නොකළ බැරකම්**

**--------------------------**

අමාත්‍යාංශය විසින් 2014 දෙසැම්බර් 31 දිනට වර්ෂයට අඩු බේරුම් නොකළ බැරකම් රු. 1,216,920 ක් විය.

**3.5 අනුකූල නොවීම්**

**-----------------**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**--------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 104(1) | 249,296 | වාහන අනතුරු 04 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව අලාභය නිශ්චය කිරිම හා එහි වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගැනීම සඳහා මාස 3 ක සිට මාස 9 ක් දක්වා කාල පරාසයක පමාවන් සිදු කර පරික්ෂණ ආරම්භ කර තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 396(ඇ) | 52,224 | නිකුත් කළ නමුත් බැංකුව වෙත ඉදිරිපත් නොවූ මාස 06 ක කල් ඉක්මවූ චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

## 3.6 කාර්යසාධනය

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### (අ) ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්

අමාත්‍යාංශය සිය අරමුණුවලට අදාල කාර්යවලින් බැහැරව ක්‍රියා කළ අවස්ථා නිරීක්ෂණය වූ අතර, නියැදි විගණන පරීක්ෂණවලදී එසේ අනාවරණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) අමාත්‍යාංශය යටතේ පවතින ආයතන 22 ක් වාණිජමය වශයෙන් ඵලදායි ආයතන බවට පත් කිරීමට අපොහොසත් වීම.

(ii) අමාත්‍යාංශය යටතේ පවතින ආයතනවල සේවක වැටුප්, හිඟ පාරිතෝෂික හා අර්ථසාධක ගෙවීම් එකතුව රු.මිලියන 884,819,476 ක පුනරාවර්තන වියදම් මූලධන ප්‍රතිපාදන යටතේ වැය තිබුණි.

**3.7 අවිධිමත් ගනුදෙනු**

----------------------

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු විධිමත් බවින් තොර වූ ගනුදෙනු කිහිපයක් පහත දැක්වේ.

**(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

---------------------------------------------------------------------

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 3.4 මාර්ගෝපදේශය ප්‍රකාරව අවම වශයෙන් ආයතන තුනකින්වත් මිල ගණන් කැඳවිය යුතු වුවද, එක් ආයතනයකින් පමණක් මිල ගණන් කැඳවා රු.619,103 ක් වටිනා ගෘහ භාණ්ඩ හා උපකරණ මිලදී ගෙන තිබුණි.

**(ආ) කේන්ද්‍රාපසාරී කර්මාන්ත ශාලාව බඳු දීම**

----------------------------------------------

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මාවනැල්ල පිහිටි කේන්ද්‍රාපසාරී රබර් කර්මාන්ත ශාලාව බඳු දීම සඳහා අභිලාෂ පළකිරීමට 2011 මාර්තු 05 දින කැඳවා තිබූ අතර ඒවා ඇගයීම් කිරීමේදී අභිලාෂ පළකළ ආයතනවල ආයෝජන වටිනාකම් ඇගයීම් කර ලකුණු ලබාදීමේදී එම ආයතනවල මූල්‍ය ප්‍රකාශන නිසි පරිදි විශ්ලේෂණය කර ඇගයීම් කර නොතිබුණි.

(ii) තැන්පතු මුදල සඳහා ලකුණු ලබාදීමේදී තැන්පතු මුදල සඳහන් කර නොතිබුණු ආයතනයක තැන්පතු මුදල රු.මිලියන 60 ක් ලෙස ඇගයීම් පත්‍රවල ව්‍යාජව දක්වා ලකුණු ලබාදී තිබුණි.

(ඇ) අමාත්‍යවරයා වෙත නිල නිවාස ලබාදීම

--------------------------------------------

රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යවරයා විසින් වර්ෂ 2 කට වැඩි කාලයක් සඳහා නිල නිවාස 2ක් භාවිතාකර තිබුණි.

## 3.8 අනාර්ථික ගනුදෙනු

-----------------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) පාසල් ළමුන්ට බෙදාදීම සඳහා අභ්‍යාස පොත් මිලදී ගැනීමේදී අවම මිල නොසළකා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයකින් මිලදී ගැනීම හා එම ආයතනය පොත් මුද්‍රණය නොකිරීම හේතුවෙන් රු.75,000 ක අලාභයක් සිදු වී තිබුණි.

(ආ) මාවනැල්ලේ පිහිටි ටයර් හා ටියුබ් කර්මාන්ත ශාලාවේ යන්ත්‍ර සූත්‍ර බදු දීම සඳහා රජයේ තක්සේරුවට වඩා අඩු ලංසුවක් ලැබීම හේතුවෙන් යන්ත්‍ර සූත්‍ර ගලවා විකිණීමේ පදනම මත නැවතත් තක්සේරු වාර්තාවක් ලබා ගනිමින් යන්ත්‍ර සූත්‍ර විකිණීම හේතුවෙන් රු.මිලියන 66 ක් වටිනා යන්ත්‍ර සූත්‍ර රු.මිලියන 22 ට 2012 මාර්තු 14 දින විකුණා තිබුණි.

## 3.9 මානව සම්පත් කළමනාකරණය

------------------------------------

අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

----------------------------------------------------

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 19 | 16 | 03 | - |
| (ii) | තෘතියික මට්ටම | 03 | 02 | 01 | - |
| (iii) | ද්විතියික මට්ටම | 56 | 32 | 24 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 36 | 33 | 03 | - |
| (v) | වෙනත් | - | 01 | - | 01 |
| | එකතුව | 114 | 84 | 31 | 01 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

බඳවාගෙන තිබුණු අතිරික්ත සේවකයෙකු වෙනුවෙන් විධිමත් අනුමැතිය ලබාගැනීමට ආයතනය කටයුතු කර නොතිබුණි.